www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## කෘෂි හා ආහාර තාක්ෂණය - I

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 01යි.

සැ.යු

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) ශ්‍රී ලංකාව "පෙරදිග ධාන්‍යාගාරය" යන විරුදාවලිය ලැබුවේ කිනම් රජ සමයක දී ද?
(1) පණ්ඩුකාභය. (2) දුටුගැමුණු. (3) මහසෙන්. (4) පැරකුම්බා.

(02) වැවක අංග අතරින් වැව් බැම්මට ජලය මගින් ඇතිකරන පීඩනය අවම කිරීම සඳහා නිර්මාණය කර ඇති අංගය කුමක් ද?
(1) රළපනාව (2) සොරොව්ව (3) බිසෝකොටුව (4) වාරි ඇළ

(03) සූර්ය විකිරණමානය භාවිතයෙන් මනිනු ලබන කාලගුණික පරාමිතිය වන්නේ,
(1) ආලෝක තීව්‍රතාව (2) ආලෝකය පවතින කාලසීමාව
(3) ආලෝකයේ ගුණාත්මය (4) වායුගෝලීය උෂ්ණත්වය

(04) විද්‍යාත්මක වර්ගීකරණය හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - විද්‍යාත්මක වර්ගීකරණයේ දී සලකා බලනුයේ ශාකවල උද්භිද විද්‍යාත්මක ලක්ෂණයි.
B - ද්විපද නාමකරණයේ දී මුල් පදය සුළු නාමය වන අතර දෙවන පදය ගණ නාමය වේ.
C - දනට පිලිගත් විද්‍යාත්මක නාමකරණය ඉදිරිපත් කරන ලද්දේ කැරෝලස් ලිනේයස් නම් විද්‍යාඥයා විසිනි
එම ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි. (4) B හා C පමණි

(05) වී බීජ ප්‍රරෝහණයේ සිට පුෂ්ප මූලාකෘති ඇති වීමේ අවස්ථාව දක්වා කාලය,
(1) වර්ධක අවධිය යි. (2) ප්‍රජනක අවධිය යි. (3) මේරීමේ අවධිය යි. (4) බණ්ඩි අවධිය යි.

(06) තවානක් සැකසීමේ දී අනුගමනය කලයුතු පියවර පහත දක් වේ.
A - තවාන් මිශ්‍රණය හා තවාන සැකසීම.
B - තවාන් පීවානුහරණය
C - සුදුසු ස්ථානයක් තේරීම.
D - රෝපණ ද්‍රව්‍ය සංස්ථාපනය
එම පියවර නිවැරදි අනුපිළිවෙලට ප්‍රකාශ වන්නේ
(1) A, B, C, D (2) C, A, B, D (3) C, B, A, D (4) C, A, D, B

(07) ජල සම්පාදන ක්‍රම අතුරින් වඩාත්ම කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රමය වන්නේ
(1) බෙසම් ජල සම්පාදනය. (2) ඉසින ජල සම්පාදනය.
(3) ඇලි හා වැටි ජල සම්පාදනය. (4) බිංදු ජල සම්පාදනය.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(08) ශාකවලට වැළඳෙන රෝග හා රෝග කාරක කිහිපයක් පහත වගුවේ දක්වේ. ඒවායින් නිවැරදි ගැළපීම තෝරන්න.

| | ශාක රෝගය | රෝගකාරකය |
|---|---|---|
| A | හිටු මැරීම | වෛරස් |
| B | මලකඩ රෝගය | දිලීර |
| C | පත්‍ර විචිත්‍ර රෝගය | බැක්ටීරියා |
| D | කහවන් කුරුවීම | වට පණුවන් |

(1) A (2) B (3) C (4) D

(09) ද්විතීයික බිම් සැකසීමේ උපකරණයක් ලෙස සැලකිය නොහැක්කේ පහත කවර උපකරණය ද?
(1) කොකු නගුල (2) අත් පෝරුව (3) තැටි නගුල (4) උදැල්ල

(10) කාලගුණික මධ්‍යස්ථානයක් විසින් ප්‍රකාශ කරන ලද නිවැරදි නිවේදනය ලෙස සැලකිය හැක්කේ,
(1) ගත වූ පැය විසිහතර තුළ කොළඹ දිස්ත්‍රික්කයට 25ml ක වර්ෂාපතනයක් ලැබුණි.
(2) ගත වූ පැය විසිහතර තුළ ගාල්ල දිස්ත්‍රික්කයේ සුළඟේ වේගය $10mh^{-1}$ විය.
(3) ගත වූ පැය විසිහතර තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයට අඩුම වර්ෂාපතනයක් ලැබුණු අතර එය 8mm ලෙස සඳහන් විය.
(4) ගත වූ පැය විසිහතර තුළ මාතර දිස්ත්‍රික්කයට ලැබුණු වර්ෂාපතනය 30cm විය.

(11) ඉසින ජල සම්පාදන ක්‍රමය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
A - සුළඟ අධික ප්‍රදේශවල වාෂ්පීකරණයෙන් ජලය අපතේ යයි.
B - බෝගවල පරාගනයට බාධා ඇතිවිය හැකිය.
C - උසින් වැඩි බෝග සඳහා ද යොදාගත හැකි ය.
සත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) A හා B (2) B හා C (3) A හා C (4) A B හා C

(12) මෙම රූපාන්තරණය පෙන්වන කෘමි වර්ගයක් වන්නේ,
(1) පළතුරු මැස්සා. (2) අවුලකපෝරා.
(3) දුඹුරු පැළ කීඩෑවා. (4) රතු පොල් කුරුමිණියා.




(13) වට්ටක්කා, කරවිල වැනි බෝග සඳහා ද යොදාගත හැකි තවාන් වර්ගයකි.
(1) වැලි තවාන් (2) කුට්ටි තවාන් (3) බඳුන් තවාන් (4) ඩැපොග් තවාන්

(14) පහත බෝග අතුරින් වාර්ෂික බෝග පමණක් ඇතුලත් වන වරණය තෝරන්න.
(1) සෝයා බෝංචි, මෑ, ගම්මිරිස්, මිරිස්
(2) බණ්ඩක්කා, රඹුටන්, කරවිල, මෑ
(3) මිරිස්, කරවිල, බෝංචි, මෑ
(4) බණ්ඩක්කා, දෙළුම් කැරට්, ගෝවා

(15) සිසුවෙක් රෝල් ක්‍රමය මඟින් පාංශු වයනය නිර්ණය කිරීමේ දී පහත ආකාරය නිරීක්ෂණය කරන ලදී. එයට ගැලපෙන පස් වර්ගය වනුයේ,



(1) මැටි ලෝම පසකි. (2) වැලි ලෝම පසකි.
(3) වැලි පසකි. (4) මැටි පසකි.

(16) දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවන ලද වර්ෂය වන්නේ,
(1) 1925 (2) 1822 (3) 1960 (4) 1912



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(17) විදේශ ආක්‍රමණ මගින් දේශීය කෘෂිකර්මාන්තයට සිදු වූ බලපෑම් කිහිපයක් පහත දැක් වේ.

A - මුඩු බිම් පනත මගින් සියළුම පරිහරණය නොකළ හෝ වගා නොකළ ඉඩම් රජයට අයිති දේපල සේ සලකන ලදී.

B - ශ්‍රී ලංකාවේ වාරි මාර්ග පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

C - වැවිලි බෝග වගාව සඳහා දකුණු ඉන්දියාවෙන් ශ්‍රමිකයන් මෙරටට ගෙන්වන ලදී.

ඉහත ප්‍රකාශ අතරින් බ්‍රිතාන්‍ය යටත් විජිත සමය හා සම්බන්ධ වන්නේ

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A හා C පමණි. (4) A, B හා C පමණි.

(18) සහතික කළ බිත්තර වී වල තිබිය යුතු අවම පැළවීමේ ශක්තිය විය යුත්තේ,

(1) 95% (2) 85% (3) 80% (4) 90%

(19) වල් පැළෑටි සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පාංශු සංරක්ෂණය කෙරෙහි වල් පැළෑටි වල බලපෑමක් නැත.
(2) සියලුම වල් පැළෑටි රෝග කාරක ජීවීන්ට ධාරක ශාක ලෙස ක්‍රියාකරයි.
(3) සෑම විට ම වල් පැළෑටි නිසා සිදුවන්නේ හානියකි.
(4) අස්වනුවල ගුණාත්මකභාවය අඩු කිරීමට වල් පැළෑටි හේතු සාධක වේ.

(20) බෝග වගාවේ දී කාබනික පොහොර භාවිතයේ වාසියක් වන්නේ,

(1) යෙදිය යුතු පොහොර ප්‍රමාණය අඩු වීම.
(2) පාංශු වයනය ද දියුණු කළ හැකි වීම.
(3) ඉක්මනින් ශාකවලට පෝෂක අවශෝෂණය කරගත හැකි වීම.
(4) ශාකවලට අත්‍යාවශ්‍ය පෝෂක සියල්ලම පාහේ ලබාදිය හැකි වීම.

(21) ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවේ පසේ පවතින ජල වර්ග / වර්ගය වන්නේ,

(1) ගුරුත්වාකර්ෂණ ජලය පමණි. (2) කේෂාකර්ෂණ ජලය හා ජලාකර්ෂණ ජලය පමණි
(3) ජලාකර්ෂණ ජලය පමණි. (4) කේෂාකර්ෂණ ජලය හා ගුරුත්වාකර්ෂණ ජලය පමණි

(22) පාෂාණ වර්ග සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ ,

A - ෂෙල් යනු අවසාදිත පාෂාණයකි.

B - මැග්මා සිසිල් වීමෙන් පසු ඝනීභවනය වී සෑදෙන පාෂාණ ආග්නේය පාෂාණ නම් වේ.

C - නයිස් යනු හුණුගල් හා ඩොලමයිට් විපරිත වීමෙන් සෑදෙන පාෂාණ වර්ගයකි.

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි. (4) සියල්ලම

(23) 60cm × 60cm × 60cm ප්‍රමාණයේ වගා වලක් සුදුසු වන්නේ පහත කිනම් බෝගයක් සංස්ථාපනය සඳහා ද?

(1) පොල් (2) කෙසෙල් (3) බණ්ඩක්කා (4) මිරිස්

(24) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ හා තෙත් කලාපයේ බහුල ව දක්නට ලැබෙන පාංශු කාණ්ඩ පිළිවෙලින්,

(1) දියළු පස, රතු දුඹුරු පස
(2) රෙගසෝල් පස, රතු කහ පොඩ්සොලික් පස
(3) රතු දුඹුරු පස, රතු කහ පොඩ්සොලික් පස
(4) රතු කහ පොඩ්සොලික් පස, රතු දුඹුරු පස

(25) බඩ ඉරිඟු වගාවක සමහර ශාකවල පත්‍ර දම් පැහැයට හුරු තද කොළ පැහැයක් ගෙන ඇති බව නිරීක්ෂණය කළේය. මෙය කුමන පෝෂක ඌනතාවයක් ද?

(1) නයිට්‍රජන් (2) පොස්පරස් (3) පොටෑසියම් (4) කැල්සියම්

(26) දිගු දින ශාක පමණක් ඇතුලත් වන බෝග කාණ්ඩය වන්නේ,

(1) බීට්, ස්ට්‍රෝබෙරි , රාබු (2) කැරට් , රාබු, අර්තාපල්
(3) මිරිස්, කව්පි බෝංචි (4) එළඹු , උක්, පොල්

(27) පළිබෝධ පාලන ක්‍රම කිහිපයක් පහත සඳහන් වේ.

A - ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය

B - බෝග මාරු කිරීම

C - සමතුලිත පොහොර භාවිතය

මේවායින් ශෂ්‍ය විද්‍යාත්මක පළිබෝධ පාලන ක්‍රමයට අයත් වන්නේ

(1) A හා B (2) B හා C (3) A හා C (4) A, B, C යන තුනම



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(28) උප පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමයකට උදාහරණයකි.
(1) තීරු ජල සම්පාදනය (2) මැටි කළ වැලලීම. (3) බිංදු ජල සම්පාදනය (4) බේසම් ජල සම්පාදනය

(29) ශාක මගින් පසෙන් උරාගන්නා ජලය ශාක පත්‍ර මගින් වාෂ්ප ලෙස පිටවීම හඳුන්වන්නේ,
(1) වාෂ්පීකරණය ලෙස ය. (2) වාෂ්පීභවනය ලෙස ය.
(3) උත්ස්වේදනය ලෙස ය. (4) පෘෂ්ඨීය අපදාවය ලෙස ය.

(30) උෂ්ණත්වයේ හිතකර බලපෑමක් වන්නේ,
(1) උෂ්ණත්වය වැඩි වන විට පුටිකා වැසී උත්ස්වේදනය පාලනය කිරීම.
(2) වැඩි උෂ්ණත්වයේ දී පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වැඩිවීම
(3) වැඩි උෂ්ණත්වයේ දී පුෂ්ප හා පරාග වියළීම.
(4) උෂ්ණත්ව වැඩිවීම නිසා සෞම්‍ය කලාපික බෝගවල මල් පිපීම.

(31) ඒකාබද්ධ පළිබෝධ පාලනය පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ
A - පළිබෝධ පාලන ක්‍රම කිහිපයක් එකවර යොදා ගනියි.
B - අනිවාර්යෙන් ම රසායනික පළිබෝධනාශක භාවිතා කළ යුතුය.
C - පරිසර හිතකාමී ක්‍රමයක් ලෙස යොදාගත හැක.
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A, B හා C ය.

(32) A, B, C, D, යනු පොහොර වර්ග කිපයකි.
A - කොම්පෝස්ට් B - කුකුල් අතුරණුව C - රොක් පොස්පේට් D - කැට පොහොර
මේවායින් කාබනික පොහොර වන්නේ,
(1) A හා B (2) B හා C (3) C හා D (4) A, B හා C

(33) පිළිවෙලින් යල කන්නයේ හා මහ කන්නයේ බෝග අස්වනු නෙළීමට සුදුසු මාස වන්නේ,
(1) පෙබරවාරි, අගෝස්තු (2) ජූලි, අගෝස්තු
(3) අගෝස්තු, පෙබරවාරි (4) ජුනි, දෙසැම්බර්

(34) තක්කාලි ශාකය අයත් ශාක කුලය වන්නේ,
(1) මැල්වේසියේ. (2) සොලනේසියේ. (3) කුකර්බිටේසියේ. (4) පොඒසියේ.

(35) ශාකය පසෙන් උදුරා අස්වනු නෙලනු ලබන බෝග සඳහා වඩාත් සුදුසු පාත්ති වර්ගයකි.
(1) උස් වූ පාත්ති (2) ගිල් වූ පාත්ති (3) වැටි හා කාණු (4) තනි වගා වළවල්

(36) වී වගාව සඳහා මතුපිට පොහොර යෙදීමට වඩාත් උචිත ක්‍රමය වන්නේ,
(1) ඉසීම. (2) පැළ වටා යෙදීම
(3) පේළියට යෙදීම (4) වගා බිමේ තැනින් තැනට යෙදීම.

(37) බෝග සංස්ථාපනයේ දී නිවැරදි පරතර භාවිතයේ වාසියක් නොවන්නේ,
(1) රෝග හා පළිබෝධ හානි අවම වීම. (2) ශාක අතර තරඟකාරීත්වය අඩු වීම.
(3) ප්‍රරෝහණය පහසු වීම. (4) අතු පැතිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් වීම.

(38) පහත බෝග අතුරින් බීජ එකවරම ක්ෂේත්‍රයේ සිටවනු ලබන බෝගය වන්නේ,
(1) මිරිස් (2) තක්කාලි (3) වම්බටු (4) බණ්ඩක්කා

(39) බෝග වගාවකට සුදුසු පසක, පාංශු සංඝටක තිබිය යුතු ප්‍රතිශත පහත රූපයේ දක් වේ. A,B,C හා D පිළිවෙලින් දක්වෙන්නේ




(1) ජලය, කාබනික ද්‍රව්‍ය, වාතය, ඛණිජ
(2) ඛණිජ, ජලය, වාතය, කාබනික ද්‍රව්‍ය
(3) ජලය, වාතය, කාබනික ද්‍රව්‍ය, ඛණිජ
(4) කාබනික ද්‍රව්‍ය, ජලය, වාතය, ඛණිජ

(40) බෝගවලට නයිට්‍රජන් ලබාදීමට බහුලව යොදා ගැනෙන රසායනික පොහොරක් වන්නේ,
(1) මියුරේට් ඔෆ් පොටෑෂ් (2) ත්‍රිත්ව සුපර් පොස්පේට්
(3) යූරියා (4) කීසරයිට්



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## කෘෂි හා ආහාර තාක්ෂණය - II

නම/විභාග අංකය :- ................................................................ කාලය: පැය 02යි.

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) තෙත් කලාපයේ පිහිටි පාසල් ගෙවත්තක බෝග සිටුවීම සඳහා සිසුන් බිම් සැකසීම සිදුකරන ලදී. එම භූමිය මඳ වශයෙන් බෑවුම් වූ අතර එහි පහළ ප්‍රදේශයේ ජලය රැඳී ඇති බව දැකගත හැකිවිය.

(i) මෙම පාසල අයත් දේශගුණික කලාපයේ වාර්ෂික වර්ෂාපතනය කොපමණ ද?

(ii) වගාව සඳහා බිම් සැකසීමේ දී පහත සඳහන් පියවර අනුගමනය කිරීමට සිදු වේ. එම එක් එක් පියවරේ දී සිදුකරන ක්‍රියාවක් බැගින් සඳහන් කරන්න.

(a) ප්‍රාථමික බිම් සැකසීම. (b) ද්විතියික බිම් සැකසීම

(iii) (a) පසේ ඇති අතිරික්ත ජලය භූමියෙන් ඉවත් කිරීම හඳුන්වන්නේ කෙසේ ද?

(b) පසේ අතිරික්ත ජලය තිබීම නිසා ඇතිවන ගැටලු දෙකක් සඳහන් කරන්න.

(iv) (a) පාංශු හායනය අර්ථ දක්වන්න.

(b) බෑවුම් භූමිවල පාංශු ඛාදනය වලක්වා ගැනීමට යොදාගත හැකි ජෛව විද්‍යාත්මක ක්‍රමයක් සඳහන් කරන්න.

(v) තවානක් සඳහා උචිත ස්ථානයක් තෝරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

(vi) භූ තල ජල සම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න.

(vii) වගා බිමක වල් පැළෑටි තිබීම නිසා ඇති විය හැකි හානි දෙකක් ලියන්න.

(viii) රසායනික පළිබෝධනාශක ක්ෂේත්‍රයට යෙදීමේ දී අනුගමනය කළයුතු ආරක්ෂණ පිළිවෙත් දෙකක් සඳහන් කරන්න.

(ix) (a) ඔබේ ගෙවත්තේ කොළ පොහොර ලෙස භාවිතා කලහැකි ශාක වර්ග දෙකක් සඳහන් කරන්න.

(b) කොළ පොහොර භාවිතයේ දී වැදගත් වන කරුණු දෙකක් දක්වන්න.

(x) පහතරට තෙත් කලාපයේ කුඹුරුවල පසේ ඇතිවිය හැකි අහිතකර තත්ත්ව දෙකක් දක්වන්න.

(02) බෝග වගාවේ දී පාංශු පරිසරය මනාව පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

(i) (a) පාංශු ජීර්ණයේ ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

(b) දර්ශීය පාංශු පැතිකඩක ප්‍රධාන කලාප නම් කළ රූප සටහනක් ඇසුරින් පෙන්නුම් කරන්න.

(ii) පසේ ව්‍යුහය වැඩි දියුණු කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(iii) (a) බිම් සැකසීමේ අරමුණු තුනක් ලියන්න.

(b) විවිධ බෝග වගාවන් සඳහා සකස් කරනු ලබන පාත්ති වර්ග හතරක් සඳහන් කරන්න.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(03) බෝග වගාවේ දී ශාක වර්ධනය සඳහා ප්‍රමාණවත් තරම් ජලය වර්ෂාවෙන් නොලැබේ නම් ජල සම්පාදනය කිරීමට සිදු වේ.

(i) බෝග ශාකවලට ජලයේ ඇති වැදගත්කම් දෙකක් ලියන්න.

(ii) (a) ප්‍රධාන ජල සම්පාදන ක්‍රම හතර නම් කරන්න.

(b) වැසි ජල සංරක්ෂණයේ වාසි දෙකක් සඳහන් කරන්න.

(iii) (a) පහත සඳහන් පෝෂක අඩංගු වන සෘජු පොහොර වර්ග දෙක බැගින් නම් කරන්න.

1. නයිට්‍රජන් 2. පොස්පරස්

(b) බෝග වගාවේ දී පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු දෙකක් ලියන්න.

(04) බෝග වර්ග කාණ්ඩ කර හෝ වෙන් කර දැක්වීම බෝග වර්ගීකරණය ලෙස හැඳින් වේ.

(i) කෘෂිකාර්මික බෝග වර්ගීකරණයේ දී යොදාගන්නා නිර්ණායක තුන නම් කරන්න.

(ii) (a) කුකර්බිටේසියේ කුලයට අයත් බෝග වර්ග තුනක් නම් කරන්න.

(b) එම කුලයේ ශාකවල ඵලයට හානි කරන කෘමි පළිබෝධකයෙකු නම් කරන්න.

(iii) වගා භූමිය තුළ (b) හි සඳහන් කරන ලද පළිබෝධ කෘමියා පාලනය කර ගත හැකි ක්‍රම තුනක් ලියන්න.

(05) මනා ශාක වර්ධනයක් හා උසස් අස්වැන්නක් ලබා ගැනීමට නම් කාලගුණය හා දේශගුණය පිළිබඳව සැළකිලිමත් විය යුතු ය.

(i) (a) කාලගුණය හා දේශගුණය අතර වෙනස පැහැදිලි කරන්න.

(b) බෝග වගාවේ දී වැදගත් වන කාළගුණික පරාමිතීන් හතරක් සඳහන් කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීයව උෂ්ණත්වය වෙනස් වීමට බලපාන හේතු දෙකක් ලියන්න.

(iii) (a) ශ්‍රී ලංකාවේ වගා කන්න මොනවා ද?

(b) එක් එක් වගා කන්නයේ දී ප්‍රයෝජනවත් වන වර්ෂාපතන රටාවන් සඳහන් කරන්න.

(06) ශාකයකට පීඩාකාරී වන අසාමාන්‍ය කායික ක්‍රියාදාමයක් ශාක රෝගයක් ලෙස හැඳින්විය හැකි ය.

(i) ශාකයකට රෝගයක් වැළඳීමට සම්පූර්ණ වියයුතු සාධක තුන නම් කරන්න.

(ii) (a) බෝග ශාකවලට වැළඳෙන වෛරස් රෝග දෙකක් දක්වන්න.

(b) වෛරස් රෝග වැළඳුන විට ශාක පෙන්වන පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(iii) (a) ආක්‍රමණශීලි වල් පැළෑටි සඳහා උදාහරණ දෙකක් ලියන්න.

(b) ආක්‍රමණශීලි වල් පැළෑටි පාලනය සඳහා අනුගමනය කෙරෙන ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

(07) ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වූ බත සපයන්නේ වී වගාවෙනි.

(i) (a) වී ශාකයේ පත්‍රය කොටස් හතරකින් යුක්තය. ඒවා නම් කරන්න.

(b) පුෂ්ප මූලාකෘති ඇති වීමේ සිට පීදීම දක්වා කාලය කුමන නමකින් හැඳින්වේ ද? ඒ සඳහා ගතවන කාලය දින කීය ද?

(ii) (a) ශ්‍රී ලංකාවේ පාරම්පරික වී ප්‍රභේද දෙකක් නම් කරන්න.

(b) වැඩි දියුණු කරන ලද වී ප්‍රභේදවල ප්‍රයෝජනවත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(iii) වී වගාවේ දී භාවිත වන බෝග සංස්ථාපන ක්‍රම දෙකක් ලියන්න.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk